# දැන්වීමයි

## පේරාදෙණිය විශ්වවිද්‍යාලය
## පීඨ ශිෂ්‍ය නිලවරණය - 2017

## පශු වෛද්‍ය විද්‍යා පීඨය

1985 අංක 7 හා 1988 අංක 26 දරණ පනත්වලින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 112 (3) වගන්තිය සමඟ කියවිය යුතු 135 වගන්තිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථාව පරිදි පශු වෛද්‍ය විද්‍යා පීඨයේ 2017 වර්ෂය සඳහා ලියාපදිංචි කරනු ලබන ශිෂ්‍ය සමූහය අතරින් පීඨ ශිෂ්‍ය සංගමයේ,

i. සභාපති
ii. උප සභාපති
iii. ලේකම්
iv. සංස්කාරක
v. කණිෂ්ඨ භාණ්ඩාගාරික යන තනතුර සඳහා නිලධාරීන් සහ
vi. පහත සඳහන් ආකාරයට අදාළ සාමාජික සංඛ්‍යාවක් ද තෝරාගනු ලැබේ.

| | |
|---|---|
| ලියාපදිංචි සිසුන් 200 ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 02 ක් |
| ලියාපදිංචි සිසුන් 201 ක් සිට 400 දක්වා ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 04 ක් |
| ලියාපදිංචි සිසුන් 401 ක් සිට 600 දක්වා ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 06 ක් |
| ලියාපදිංචි සිසුන් 600 ට වැඩි සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් | 08 ක් |

2003 අංක 1 දරණ ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාවේ 8 වගන්තියෙහි විධිවිධාන සළසා ඇති පරිදි මෙම නිලවරණය සම්බන්ධයෙන් නිලවරණ නිලධාරී පශු වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති වන්නේය. ඉහත තනතුරු සඳහා නිලධාරීන් තේරීම් සම්බන්ධයෙන් නාම යෝජනා 2017.06.30 වන දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 අතර කාලය තුළදී පශු වෛද්‍ය විද්‍යා පීඨ පීඨාධිපති විසින් සිය කාර්යාලයේදී භාරගනු ලැබේ.

නියමිත නාම යෝජනා හා ආකෘති පත්‍ර පශු වෛද්‍ය පීඨ පීඨාධිපතිගෙන් ලබාගත යුතු අතර, පැහැදිලි අකුරින් අයදුම්පත් පිරවිය යුතුය.

අයදුම්කරු, යෝජක, ස්ථිර කරන්නා විසින් තමන් හඳුනා ගැනීම සඳහා පීඨයේ පීඨාධිපති වෙත හෝ ඔහු විසින් නම් කරනු ලබන පුද්ගලයා වෙත අනිවාර්යයෙන්ම සිය ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කළ යුතු වන්නේය. ශිෂ්‍ය වාර්තා පොතෙහි 2017/2018 වර්ෂය සඳහා නිල සටහනක් අන්තර්ගත විය යුතුවේ.

**නිලවරණය :** **2017.07.13 වෙනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පශු වෛද්‍ය විද්‍යා පීඨයේ දී පැවැත්වෙනු ඇත.**

ඡන්ද දායකයන්ගේ නම් ලැයිස්තුවක් 2017.06.20 වන දින පෙ.ව. 9.00 සිට පීඨයේ ප්‍රධාන දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ලැබේ. මෙම ලැයිස්තුවේ කිසියම් හෝ වැරදීම්, අත්හැරීම් ඇති නම් එබඳු අඩුපාඩුකම් සම්බන්ධයෙන් 2017.06.30 වෙනි දින හෝ ඊට පෙර පීඨාධිපති හෝ ඔහු විසින් නම් කරනු ලබන්නෙකු වෙත හෝ ලිඛිතව දැනුම්දිය යුතුවේ. 2017.06.30 වන දින ප.ව. 4.00 ට පසුව එබඳු යම් නිවැරදි කිරීම් සම්බන්ධව ඡන්දදායකයන්ගේ ඉල්ලීම් භාරගනු නොලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් සම්පාදනය කරන ලද යථෝක්ත අතුරු ව්‍යවස්ථාවේ පිටපතක් ද පීඨයේ ඇති දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කරනු ඇත.

ලේඛකාධිකාරී
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2017.06.12

27 JUN 2017

# NOTICE

**UNIVERSITY OF PERADENIYA**
**FACULTY STUDENTS UNION ELECTION – 2017**

**FACULTY OF VETERINARY MEDICINE AND ANIMAL SCIENCES**

By-Law made by the Council of the University of Peradeniya under Section 135 read with Section 112(3) of the Universities Act No. 16 of 1978 as amended by Act Nos. 7 of 1985 and 26 of 1988, the following Office bearers of the Faculty Students' Union have to be elected from among the general body of the students registered for the year 2017 in the Faculty of Vet. Medicine and Animal Sciences.

(i) President
(ii) Vice-President
(iii) Secretary
(iv) Editor
(v) Junior Treasurer and
(vi) Such other number of members as determined in the following manner
02 members for a Faculty with 200 or less registered students
04 members for a Faculty with 201 to 400 registered students
06 members for a Faculty with 401 to 600 registered students
08 members for a Faculty with over 600 registered students

As provided for in Section 8 of the Students Union By-Law No. 1 of 2003, the Election Officer for purpose of this Election shall be the Dean of the Faculty of Vet Medicine and Animal Sciences. ***Nomination for election to the above posts will be received by the Dean/Vet. Medicine and Animal Sciences at his office on 30.06.2017 between 1.00 p.m. & 4.00 p.m.***

Nominations shall be submitted on prescribed forms obtainable from the Dean/Vet Medicine and Animal Sciences. Nomination application forms should be filled in block letters.

Every nominee, proposer and seconder shall for the purpose of identification, produce his/her Student Record Book to the Dean/ Vet. Medicine and Animal Sciences or to his nominee. The Student Record Book should carry an official endorsement for the validity of year 2017/2018.

The election will be held on **13.07.2017** at the **FACULTY OF VETERINARY MEDICINE AND ANIMAL SCIENCES from 9.00 a.m. to 4.00 p.m.**

The List of Voters will be displayed on the main Notice Board in the Faculty **20.06.2017 from 9.00 a.m.** onwards. If there are any errors or omissions in this List of Voters, the same should be brought to the notice of the Dean or his nominee on or before 30.06.2017 in writing. Any appeals for correction of Voters' List will not be entertained after 4.00 p.m. on 30.06.2017.

A copy of the above By-Law made by the Council of the University of Peradeniya will also be displayed on the Notice Board in the Faculty.

**Registrar**
University of Peradeniya

Registrar
University of Peradeniya
Peradeniya